## 61 – මහ කරුණා

මහ කරුණා මෙතින් ඔබේ අනේ දෙවියනේ වන්නැ මට දයා
අනුකම්පා බරින් ඔබේ මකා දමන්නේ මගේ දොස් පමා
දොවනු අනේ තව තව මගේ / කෙලෙස් මලින් මා //
පිවිතුරුවට පිසැ දමන්නැ / පව් කම්නුත් මා //

මා කළ නොපණත් කම් මම දනිම් හොඳට ඒ මගෙ බර පාපේ
මගේ සිතින් නොමැකීමැයි ඒ පවතින්නේ තිස්සෙ දෙවේලේ
ඔබටමැ හතුරුවැ පමණෙකි / මා පව් කෙරුවේ //
ඔබේ ඇසට පිළිකුල් දේ / මා සිදු කෙරුවේ //

ගැලවුම් කරු දෙවිසුරුණේ මගෙ බර පාපෙන් මා ගලවන්නේ
තවද මගේ දිව ඔබගේ ගුණ කඳ සඳහා තොස පතුරන්නේ
හිම් සඳුනේ අනේ ළහනු / මුව විට මාගේ //
දිවද මගේ එවිටැ ඔබේ / පසස දෙසන්නේ //

ඔබට පුදන කිළිටි පුදන් කෙරේ නැත ඔබේ සතුට වඩන්නේ
ගින්නෙ දවන පුදවත් ඔබ පිළිකුලින් නොසා අහක දමන්නේ
පුළුටු පඬුර ඔබට පුදන / බිඳුණු සිත මගේ //
බැගෑ බිඳුණු හද ඔබ නැත / එපා කරන්නේ //